# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව
# புடவைக் கைத்தொழில் திணைக்களம்
# DEPARTMENT OF TEXTILE INDUSTRY



රන්සළු

ரன் சலு | RAN SALU

## 2014 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
## 2014 வருடத்திற்கான வருடாந்த செயற்பாட்டு அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT 2014

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

கைத்தொழில் மற்றும் வணிக அமைச்சு

MINISTRY OF INDUSTRY AND COMMERCE

## *පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව*

## 2014 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

### 01 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

### 1.1 දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

### 1.2 මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම. එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

### 1.3 අරමුණු

01. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
02. නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම
    * ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
    * මෝස්තර සම්පාදන වැඩසටහන්
    * පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
03. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම
04. ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම
05. අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)
06. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම

07. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම

08. ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම

09. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු

10. නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

| | | |
|---|---|---|
| **01.** | පර්යේෂණ, පුහුණු,මෝස්තර හා සේවා ආයතනය-කටුබැද්ද (පේෂකර්මාන්ත කෞතුකාගාරය, රසායනාගාරය ඇතුළුව) | **- 01** |
| **02.** | ස්වාභාවික වර්ණ ව්‍යාපෘතිය, රාජගිරිය | **- 01** |
| **03.** | පේෂකර්මාන්ත පුහුණු පාසැල් | - 12 |
| **04.** | මෝස්තර පුහුණු පාසැල් | - 02 |

**2014/12/31** දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

මාණ්ඩලික නිලධාරීන්

| | | | |
|---|---|---|---|
| 1. | පේෂකර්මාන්ත අධ්‍යක්ෂ | **- 01** | |
| 2. | සහකාර අධ්‍යක්ෂ (පාලන) | **- 01** | |
| 3. | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | **- 01** | |
| 4. | පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ | **- 01** | 04 |

මාණ්ඩලික නොවන නිලධාරීන්

| | | | |
|---|---|---|---|
| 1. | කාර්මික නිලධාරී | **- 01** | |
| 2. | සංවර්ධන සහකාර | **- 08** | |
| 3. | රාජ්‍ය කළමණාකරන සහකාර සේවය | - 14 | |
| 4. | පේෂ උපදේශක | - 59 | |
| 5. | නිමහම් සහකාර | **- 01** | |
| 6. | චිත්‍ර ප්‍රදර්ශක | - 14 | 97 |

කණිෂ්ඨ සේවක

| | | | |
|---|---|---|---|
| 1. | රියැදුරු | - 03 | |
| 2. | කාර්යාල සේවක සේවය | - 04 | |
| 3. | මුරකරු | - 05 | |
| 4. | සහන මුරකරු | - 05 | |
| 5. | තාවකාලික මුරකරු | **- 05** | |
| 6. | කම්කරු | **- 08** | **30** |
| | එකතුව | | **131** |

නව බඳවා ගැනීම් හා විශ්‍රාම ගැනීම්

**2014 වර්ෂය තුළ පුරප්පාඩු වූ සිංහල මාධ්‍ය පේෂ උපදේශක තනතුරු 05ක් සම්පූර්ණ කරන ලද අතර පහත සදහන් පරිදි නිලධාරීන් විශ්‍රාම ගොස් ඇත.**

| | |
|---|---|
| **පේෂ උපදේශක** | **- 06** |
| **චිත්‍ර ප්‍රදර්ශක** | **- 01** |
| **රියදුරු** | **- 01** |
| **මුරකරු** | **- 03** |
| **සහන මුරකරු** | **- 01** |

## 02 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

### 2.1 ප්‍රතිපාදන උපයෝජනය

**2014 වර්ෂයේ සළසා තිබූ ප්‍රතිපාදන පහත පරිදි ප්‍රතිශතයන්ගෙන් උපයෝජනය කර තිබුණි.**

- **මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය** 98%

  **මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය** 92%

| වැය විෂය | | මුළු ශුද්ධ වෙන් කිරීම (2014 වර්ෂය) (රු:) | මුළු වියදම (රු:) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (රු:) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | |
| **1001** | පුද්ගල පඩිනඩි | 54,000,000 | 47,053,865 | 6,946,135 | 87% |
| **1002** | | | | | |
| **1003** | | | | | |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 373,680,700 | 371,617,067 | 2,063,633 | 99.5% |
| | | | | | |
| | මූලධන වියදම් | | | | |
| **2001** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8,000,000 | 6,393,046 | 1,606,954 | 80% |
| **2003** | වාහන | 600,000 | 550,000 | 50,000 | 92% |
| **2102** | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 1900,000 | 1,899,979 | 21 | 100% |
| **2401** | පුහුණුකිරීම් සහ හැකියා වර්ධනය | 23,200,000 | 22,150,341 | 1,049,659 | 95.5% |

## 2.2 ආදායම් ගිණුම්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනයක් බැවින් විශේෂ ආදායම් නොමැත.

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කාර්යසාධනය

| | උපරිම හර සීමාව | අවම ලැබීම් සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| වාර්ෂික විසර්ජන ගිණුමේ සීමාවන් | 5,000,000 | 2,900,000 | 30,000,000 |
| වාර්ෂික සත්‍ය වියදම | | | |
| **(303011)** | **2,465,000** | **2,946,176** | **13,897,306.91** |
| **(303012)** | **349,204** | **1,691,885** | |

## 3. වාර්ෂික කාර්යසාධනය

3.1 * කොට්ටල පේෂකර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ශාලා වෙන් කිරීම , දොරවල් සවි කිරීම හා වැසිකිළි වලක් ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම.

* වටපුළුව පේෂකර්මාන්ත පුහුණු මධ්‍යස්ථානයේ වැසිකිළි හා නාන කාමරය අලුත්වැඩියාව

* දෙපාර්තමේන්තුවේ නව කාර්යාල ගොඩනැගිල්ලෙහි (විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටි) අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.

3.2 බලවේග අංශය සම්බන්ධ කටයුතු

දෙපාර්තමේන්තුව සතුව තිබී පෞද්ගලික අංශයට විකුණනු ලැබ ඇති බලවේග ආයතන සම්බන්ධයෙන් වන කටයුතු හා එම ආයතනවල සිට රැකියා අහිමි වූ විශ්‍රාම වැටුප් හා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු වේ.

1980/81/82 වර්ෂවල පෞද්ගලීකරණය කරන ලද පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාරවල වසර 10කට අඩු කාලයක් සේවය කළ සේවකයන්ට වන්දි මුදලක් ගෙවීම සඳහා අංක 12/0865515/004-1 හා 2012-03-05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන ලදි.

මෙහිදී සේවකයන්ගේ සේවා කාලය පදනම් කරගෙන වන්දි මුදල් ලබාදීම සිදු කළ අතර එක් වර්ෂයක් සඳහා රු:17,000/- බැගින් වන්දි ප්‍රදානය කරන ලදි. මෙම වන්දි ගෙවීම අදියර දෙකක් යටතේ සිදු කළ අතර පළමු අදියර යටතේ උපරිමය රු:50,000/-කට යටත්ව 3600කට ආසන්න සේවක ප්‍රමාණයකට වන්දි ලබාදීම සිදු කරන ලදි. 2014-12-31 දින වන විට අදියර I හා අදියර II යටතේ වන්දි මුදල් ගෙවීම අවසන් කරන ලදි.

වන්දි ලබා දෙන අවස්ථාව වන විට මියගොස් සිටි, වන්දි ලබා ගැනීම සඳහා අයදුම්කර නොතිබූ, අවශ්‍ය ලියවිලි නොමැතිවීම හේතුවෙන් වන්දි ලබා ගැනීමට නොහැකිවූ සේවකයන් සඳහා වන්දි ගෙවීමට අංක අ.ම.ප./1411476/515/023 හා 2014-11-20 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

**3.3 පේෂකර්මාන්ත පුහුණු ව්‍යාපෘති**

*** පේෂකර්මාන්ත පුහුණු පාසැල් වලට සිසුන් බඳවා ගෙන පුහුණු කිරීම**

**පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසැල් 12 ක් මඟින් පවත්වන පේෂකර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි.**

**ඒ අනුව 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 142 දෙනෙකු බඳවා ගන්නා ලද අතර පාඨමාලාව අවසානයේ පවත්වන අවසාන සහතික පත්‍ර විභාගය සඳහා සිසුන් 117 දෙනකු 2014 වර්ෂයේදී පෙනී සිටින ලදි. එසේම 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා** 2014/07/01 **දින බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව** 180 **කි.**

**වේයන්ගොඩ, කොට්ටල අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත පුහුණු ව්‍යාපෘතියට සමගාමීව ආරම්භ කළ කොට්ටල පෙහෙකම් සිප් පියසේ අධ්‍යයන කටයුතු** 2014 **මාර්තු මස ආරම්භ කරන ලද අතර බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 16කි.**

*** පේෂකර්මාන්ත මෝස්තර පුහුණු පාසැල් වලට සිසුන් බඳවා ගෙන පුහුණු කිරීම**

**පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මෝස්තර පුහුණු පාසැල් දෙකකි. 2014 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගත් සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන මෝස්තර පුහුණු සහතිකපත්‍ර විභාගය 2015 ජනවාරි මාසයේදී පැවැත්වීමට කටයුතු සැළසුම් කරන ලදි.**
**(ගැටඹේ මෝස්තර පුහුණු පාසලේ සිසුන් 11ක් හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලේ සිසුන් 05ක් වශයෙනි)**

**පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසල් සහ මෝස්තර පුහුණු පාසල්**

- **කටුබැද්ද පෙහෙකම් සිප් පියස**
- **වටපුළුව පෙහෙකම් සිප් පියස**
- **ගැටඹේ පෙහෙකම් සිප් පියස**
- **මාතලේ පෙහෙකම් සිප් පියස**
- **බණ්ඩාරවෙල පෙහෙකම් සිප් පියස**
- **මාතර පෙහෙකම් සිප් පියස**
- **කිරම පෙහෙකම් සිප් පියස**
- **පින්නවල පෙහෙකම් සිප් පියස**
- **බෝයගනේ පෙහෙකම් සිප් පියස**
- **කොට්ටල පෙහෙකම් සිප් පියස**
- **නල්ලූර් පෙහෙකම් සිප් පියස**
- **සමන්තුරේ පෙහෙකම් සිප් පියස**
- **මෝස්තර පුහුණු පාසල, කටුබැද්ද**
- **මෝස්තර පුහුණු පාසල, ගැටඹේ**

**4 අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

* **දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය**

**2014 පෙබරවාරි මස කුලියාපිටිය කාර්මික විද්‍යාල පරිශ්‍රයේ දී පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ දී අත්යන්ත්‍ර පේෂකර්මාන්ත නිර්මාණ ඇතුලත් ප්‍රදර්ශන කුටියක් පැවැත්විනි.**

* **අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිල**

**දේශීය අත්යන්ත්‍ර පේෂකර්මාන්ත නිෂ්පාදකයින් සඳහා වෙළඳපල අවස්ථා උදාකරදීමෙන් ජනතාව අතර අත්යන්ත්‍ර රෙදිපිළි ජනප්‍රිය කිරීමත් ඒ සඳහා වැඩි ඉල්ලුමක් ඇති කිරිමත් අරමුණු කර ගෙන 2014 මාර්තු මස කොළඹ, කොටුව ප්‍රදර්ශන හා සම්මේලන ශාලා පරිශ්‍රයේදී පවත්වන ලදි.**

* **අත්‍යන්ත්‍ර රෙදිපිළි තරඟය හා ජාතික ප්‍රදර්ශනය**

**අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත්‍යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය හා සම්මාන උළෙල 2014 දෙසැම්බර් මස 20 – 24 දිනයන්හි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලා පරිශ්‍රයේදී පවත්වන්නට යෙදින.**

**5 සේවාස්ථ පුහුණු වැඩසටහන**

I. **පේෂකර්මාන්ත කළමණාකරුවන්, ව්‍යවසායකයින් හා උපදේශකයින් දක්වා විහිදී යන පරිදි පේෂකර්මාන්තයේ වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.**

**පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම අනුව 2014 වර්ෂයේදී පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා 41ක් පුහුණුලාභීන් 1036 දෙනෙකු සඳහා පවත්වන ලදි.**

| **පුහුණු වැඩසටහන** | **ඉලක්කගත කණ්ඩායම** |
| --- | --- |
| i. පේෂකර්මාන්තය ආශ්‍රිත පාඨමාලා 36ක් | පළාත්සභා, සමුපකාර හා පෞද්ගලික අංශයේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු වූවන් 727 දෙනෙකු සඳහා |
| ii. පෞරුෂත්ව සංවර්ධන පුහුණු වැඩමුළු 04 ක් | පේෂ පාසල් සිසුන් 289 දෙනෙකු සඳහා |
| iii. සේවා ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුවක් | දෙපාර්තමේන්තු නිලධාරීන් 20 දෙනෙකු සඳහා |

6 විභාග පැවැත්වීම

<u>පේෂකර්මාන්ත පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු</u>

- පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාග කටයුතු 2014 ජූලි මස පවත්වන ලදි. මේ සඳහා පේෂ පාසල් සිසුන් හා බාහිර අයදුම්කරුවන් 163 දෙනෙකු සහභාගි විය.

- එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2014 ජනවාරි මස බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2015 ජනවාරි මස පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසුම් කරන ලදි.

<u>දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග</u>

- දෙපාර්තමේන්තුවේ පේෂ උපදේශක I, II, III යන තනතුරුවල ද චිත්‍ර ප්‍රදර්ශක හා නිමහම් සහකාර යන තනතුරු යටතේ ද සේවය කරන නිලධාරීන් සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග 2014-12-05 සහ 2014-12-13 යන දිනයන්හි දෙපාර්තමේන්තුවේ කටුබැද්ද අංශයේදී පවත්වන්නට යෙදිනි.

7 2015 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට පූර්වගාමීව ආරම්භ කරන ලද මාතර, තලල්ල අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘතියේ පුහුණුලාභීන් 24 දෙනෙකු සඳහා පුහුණුව හා අත්යන්ත්‍ර උපකරණ නොමිලේ ලබා දීම තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි පුහුණු කර්මාන්තකරුවන් සංඛ්‍යාව ඉහළ නැංවීමට කටයුතු යෙදීම.

8 රෙදිපිළි නිර්මාණ කලාවේ ඉතිහාසය පිළිබඳව වූ සුවිශේෂී නිර්මාණ එකතුවක් රැගත්, කටුබැද්ද පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතන පරිශ්‍රයේ පිහිටි පේෂකර්මාන්ත කෞතුකාගාරය සම්බන්ධ වාර්තාමය රූපවාහිනී වැඩසටහනක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

9 ඉහළ මඩම්පැල්ල අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘතියේ III වන අදියර යටතේ පුහුණුව ලබා දුන් ප්‍රතිලාභීන් 70 දෙනෙකුට, අවශ්‍ය නූල් මිලදී ගැනීම හා අත්යන්ත්‍ර අවශ්‍යතාවය අනුව අත්යන්ත්‍ර 25ක් බෙදා දීමට කටයුතු කිරීම.

10 වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්ත කරලීමේ අරමුණෙන් ප්‍රතිලාභීන් 56 දෙනෙකු සඳහා වේයන්ගොඩ, කොට්ටල ග්‍රාමයේ අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදි.

11 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන පේෂකර්මාන්ත පුහුණු පාසල්හි ඉගැන්වීමේ ක්‍රමවේදය විධිමත් ආකාරයකින් පවත්වාගෙන යාම සඳහා පුහුණු පාඨමාලාවන්හි ඒ ඒ විෂයන්ට අදාළව අත්පොත් 05ක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

12 මඩකලපුව, පාලමුණෙයි ප්‍රදේශයේ ස්ථාපිත පේෂකර්මාන්ත පුහුණු, වර්ණ ගැන්වීමේ හා අලෙවි මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදි.

13 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අදාළව වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු කිරීම.

14 පේෂකර්මාන්ත පුහුණු පාසල් සඳහා අවශ්‍ය නූල් හා උපකරණ මිලදී ගන්නා ලදි.

15 පේෂකර්මාන්ත පුහුණු පාසල්වල පේෂකර්මාන්ත පුහණු පාඨමාලාව හදාරණ සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 2014 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කරන ලදි.

16 පේෂකර්මාන්ත පුහුණු පාසල්හි ඉගෙනුම ලබන සියළුම සිසුන් සඳහා වසරකට නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දෙන ලදි.

17 2014 වර්ෂයේ ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිල ඇඳුමක් සකස් කරන ලදි.